# ‘මේඩ් ඉන් ශ්‍රී ලංකා’ සන්නාම ලාංඡනය - ප්‍රතිලාභ නිර්ණායක

## 1. සම්මානලාභීන් සඳහා

- ✓ සහනදායී මිල ගණන් යටතේ ප්‍රදර්ශන සහ අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා සහභාගී වීමේ අවස්ථාව
  “මේඩ් ඉන් ශ්‍රී ලංකා” වැනි ජාතික මට්ටමේ ප්‍රදර්ශන සහ අනෙකුත් සහයෝගීතා සංවිධාන විසින් සංවිධානය කරන වෙළඳ ප්‍රදර්ශනවලට සහභාගි වීමේදී ප්‍රමුඛත්වය දෙනු ලැබේ.

- ✓ රජයේ ආයතනවලින් සහතික ලබා ගැනීමේදී ප්‍රමුඛතාවය
  කර්මාන්ත අමාත්‍යාංශය වැනි රාජ්‍ය ආයතනවලින් සහතික සහ අනුමැතිය ලබා ගැනීමේදී “මේඩ් ඉන් ශ්‍රී ලංකා” ලාංඡන දරන්නන්ට ප්‍රමුඛතාවය පිරිනමනු ලැබේ.

- ✓ ජාතික සහ ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ විශ්වාසනීයත්වය  සහ පිළිගැනීම
  "මේඩ් ඉන් ශ්‍රී ලංකා" රාජ්‍ය අවසරය යටතේ ප්‍රදානය කරන ප්‍රමුඛතම ජාතික සන්නාමයක් වන අතර එය ජාතික හා ජාත්‍යන්තර වෙළඳපල තුල පුළුල් පිළිගැනීමක් සහ ප්‍රවේශයක් ඇති කරයි.

- ✓ පුහුණු හා දැනුවත් කිරීමේ පහසුකම්
  විවිධ ආයතන මගින් දේශීය හා ජාත්‍යන්තර වශයෙන් සංවිධානය කරන ලද පුහුණු පහසුකම් ලබා ගැනීමේදී ප්‍රමුඛතාවය

## 2. සම්මානලාභීන්ගේ ගනුදෙනුකරුවන් සඳහා

- ✓ පාරිභෝගික පක්ෂපාතීත්වය
  "මේඩ් ඉන් ශ්‍රී ලංකා" සන්නාමය පාරිභෝගික විශ්වාසනීයත්වය ඇති කරන අතර මිල අධික සක්‍රීය අලෙවිකරණ ව්‍යාපාර සඳහා වියදම් නොකර සමාජය තුළ නිරන්තර දැනුවත්භාවය ගොඩනඟයි.

## 3. රට සඳහා

- ✓ ජාතික සන්නාමයක් ලෙස "මේඩ් ඉන් ශ්‍රී ලංකා"
  "මේඩ් ඉන් ශ්‍රී ලංකා" යනු තරඟකරුවන් අතර නිෂ්පාදන/සේවා ඉස්මතු කරන සුවිශේෂී ජාතික සන්නාමයක් වන අතර එමඟින් දේශීයව නිෂ්පාදිත නිෂ්පාදනවල විශ්වසනීයත්වය ඉහළ නංවන අතර එමඟින් ව්‍යාපාරවල විශිෂ්ටත්වයට මඟ පෑදෙයි.

- ✓ කර්මාන්තයක් ලෙස ව්‍යාපාරය දියුණු කිරීම සහ ශක්තිමත් කිරීම
  මෙවැනි සන්නාමයක් යම් ව්‍යවසායකයෙකු ජාතික නිෂ්පාදන ක්‍රියාවලීන් සඳහා සහභාගී වීම දිරිමත් කරනු ඇත.

- ✓ නිෂ්පාදනවල ගුණාත්මකභාවය සහතික කිරීමට දිරිමත් කිරීම
  ප්‍රමිතිගත සහ ස්ථාවර නිෂ්පාදන සංස්කෘතියක් සහතික කරමින් වෙළෙඳපොළ තුළ බාල නිෂ්පාදන අධෛර්යමත් කිරීමට මෙය ඉවහල් වනු ඇත.